සියලු ම හිමිකම් ඇවිරිණි

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

33	S	I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2023

උපකාරක ප්‍රශ්න පත්‍ර

විෂයය - ගිණුම්කරණය

පත්‍රය - I

කාලය - පැය 02

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති කිත් ඉර මත ලියන්න.**
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ **කිත් ඉර මත ලියන්න.**
- සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු හිමි වේ.
- **විභාග අංකය** ඉහළින් ඇති කොටුවේ පැහැදිළිව සටහන් කරන්න.
- වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

විභාග අංකය ……

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

	අත්සන	සංකේත අංකය
1 වන පරීක්ෂකගේ		
2 වන පරීක්ෂකගේ		
අති ප්‍රධාන පරීක්ෂකගේ		
ගණිත පරීක්ෂකගේ		
ප්‍රධාන පරීක්ෂකගේ		

1 පත්‍රය සඳහා	
ප්‍රශ්න අංකය	ලකුණු
1 - 30	
31 - 50	
එකතුව	

1. ආයතනයක් විසින් පිළියෙල කරන පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත සඳහන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේද?

   A - මෙම ප්‍රකාශන ප්‍රධාන වශයෙන් ආයතනයේ අතීත මූල්‍ය තොරතුරු සපයයි.

   B - බාහිර පාර්ශවයන් ඉල්ලූ විටක මෙම ප්‍රකාශ පිළියෙල කරයි.

   C - ගිණුම්කරන ප්‍රමිත සහ නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලව මෙම ප්‍රකාශ පිළියෙල කරනු ලබයි.

   (1) A පමණි. (2) A සහ B පමණි. (3) A සහ C පමණි.

   (4) B සහ C පමණි. (5) A, B සහ C යන සියල්ලම.

   (.....)

- **ප්‍රශ්න අංක 2 සිට 4 දක්වා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු හා සිද්ධීන් පහත වේ.

A **පිරිවැය රු.**160,000 **ක් වූ තොග රු.**240,000 **කට ණයට විකුණන ලදී.**

B **ණයට විකුණූ භාණ්ඩ වලින් රු.10,000 ක (පිරිවැය) තොග යල්පැන ගොස් තිබූ බැවින් ආපසු එවන ලදී.**

C **ණයට විකුණූ භාණ්ඩවලට අදාළ මුදල් රු. රු.**10,000 **ක වට්ටමකට යටත්ව ලැබුණි.**

D **රු.**80,000 **ක වෙළඳ ගෙවිය යුතු දෑ පියවීමට අයිතිකරු විසින් පෞද්ගලික මුදලින් රු.**75,000 **ක් ගෙවන ලදී.**

2. ඉහත ගනුදෙනු සටහන් කිරීමට යොදාගන්නා මූලාශ්‍ර ලේඛනවල අනුපිළිවෙල වන්නේ,
   (1) ඉන්වොයිසිය, හරපත, ලදුපත, ගෙවීම් වවුචරය.
   (2) ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වවුචරය, ගෙවීම් වවුචරය .
   (3) ඉන්වොයිසිය, බැරපත, ලදුපත, ජ'නල් වවුචරය.
   (4) ලදුපත, හරපත, ලදුපත, ජ'නල් වවුචරය.
   (5) ලදුපත, හරපත, ගෙවීම් වවුචරය, ලදුපත.

   (.....)

[දෙවන පිටුව බලන්න]

3. ඉහත ගනුදෙනුවල ශුද්ධ බලපෑම නිරූපනය කරනු ලබන ගිණුම්කරණ සමීකරණය වන්නේ,

	වත්කම් (රු.000)	වගකීම් (රු.000)	හිමිකම් (රු.000)
(1)	65	(80)	145
(2)	62	(80)	122
(3)	55	(80)	140
(4)	50	(80)	135
(5)	65	(80)	135

(.....)

4. ඉහත ගනුදෙනු සටහන් කරනු ලබන මූලික සටහන් පොත්වල අනුපිළිවෙල වන්නේ,

(1) විකුණුම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය.

(2) මුදල් ලැබීම් ජ'නලය, ආපසු යැවීම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය, පොදු ජ'නලය.

(3) විකුණුම් ජ'නලය, ආපසු යැවීම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය, පොදු ජ'නලය.

(4) විකුණුම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය, පොදු ජ'නලය

(5) මුදල් ලැබීම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය, පොදු ජ'නලය, (.....)

5. මූල්‍ය ගිනුම්කරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව පහත සඳහන් කුමන දෑ වත්කමක ලක්ෂණ වන්නේද?

A - ආයතනය විසින් පාලනය කරන සම්පතකි.

B - ඒ තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒම අපේක්ෂා කරයි.

C - එහි අගය විශ්වාසනීය ලෙස මැනිය හැකිවේ.

(1) A සහ C පමණි. (2) A සහ B පමණි. (3) A පමණි.

(4) B පමණි. (5) A,B සහ C යන සියල්ලම

(.....)

6. එක්තරා ව්‍යාපාරයක 2023.03.31 දිනට මුදල් ගිණුමට අනුව ශේෂය රු.34,000 කි. බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය රු.56,000 කි. පහත තොරතුරු ලබා දී ඇත.

A. උපලබ්ධි නොවූ චෙක්පත්	රු. 14 000
B. වෙළඳ ලැබිය යුතු දෑ සෘජු ප්‍රේෂණ	රු. 11 000
C. ස්ථාවර නියෝග ගෙවීම්	රු. 13 000
D. බැංකු ගාස්තු	රු. 2 000

ඉදිරිපත් නොවූ චෙක්වල වටිනාකම වන්නේ ?

(1) රු. 51 000 (2) රු. 40 000 (3) රු. 14 000

(4) රු. 27 000 (5) රු. 45 000

(.....)

7. 2023.03.31 දිනට අමිල පොදු සමාගමේ ශේෂ පිරික්සුම් තුලනය නොවූ අතර එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. පසුව කරන ලද විමර්ශනයකදී පහත දෑ හෙළිදරව් විය.

A වැටුප් සඳහා ගෙවූ රු.100 000 ක් මුදල් ගිණුමේ පමණක් සටහන් කර තිබුණි.

B ණයහිමියෙකුට ගෙවන ලද රු.25 000 ක් වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමේ මුදල් ලැබීම් ලෙස සටහන් කර තිබුණි.

C විකුණුම් ජ'නලය රු.30 000 ක් අඩුවෙන් එකතු කර තිබුණි.

D හානිකරන අලාභ කපා හැරීම් රු.20 000 ක් ආදායමක් ලෙස සටහන් කර තිබුණි.

ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය,

(1) 145 000 හර (2) 145 000 බැර (3) 190 000 හර

(4) 190 000 බැර (5) 220 000 බැර (.....)

8. සුසන්තගේ වෙළඳ ව්‍යාපාරයේ 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරුඔබට සපයා ඇත.

	රු.'000
• වෙළඳ ලැබිය යුතු දෑ වැඩි වීම	200
• වෙළඳ බඩු තොග අඩු වීම	600
• වෙළඳ ලැබිය යුතු දෑ ලැබීම්	2 000

- වර්ෂයේ විකුණුම්වලින් 50% ක් ණයට සිදු වී ඇත.
- දළ ලාභය පිරිවැයට 25% ක් වේ.
- වෙළඳ ලැබිය යුතු දෑ වලට අදාළව වෙනත් ගනුදෙනු සිදු වී නොමැත.

2022/2023 වර්ෂයේ ගැනුම් වටිනාකම වන්නේ,

(1) රු. 4 120 000 (2) රු. 2 920 000 (3) රු. 2 700 000 (4) රු. 3 300 000 (5) රු. 3 240 000

(.....)

9. ව්‍යාපාරික ආයතනයක කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසු පහත දැක්වෙන වැරදි අනාවරණය විය.

A - ණයගැතියෙකුගෙන් ලද රු.18 500 ක මුදලක් රු. 15 800 ක් ලෙස වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමේ සටහන් වී ඇත.

B - ණයට විකුණුම් රු. 25 000 ක්, රු. 2 500 ක් ලෙස විකුණුම් ගිණුමට බැර කර ඇත.

C - ආපසු එවීම් රු. 3 000 ක් විකුණුම් ගිණුමට හර කර ඇත.

මෙම වැරදි නිසා ආයතනයේ ලාභය අවතක්සේරු වී ඇත්තේ,

(1) රු. 18 500 කින් ය. (2) රු. 22 500 කින් ය. (3) රු. 25 200 කින් ය.
(4) රු. 25 500 කින් ය. (5) රු. 28 200 කින් ය.

(.....)

10. 2022.03.31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශයේ උද්ධෘතයන් පහත දී ඇත.

- මුළු වත්කම රු.200 000
- මුළු හිමිකම රු.150 000

2023.03.31 දිනෙන් අවසන් වන වර්ෂයේ පහත ගනුදෙනු සිදුවිය.

A - ගැනිලි	රු. 75 000
B - යොදවන ලද නව ප්‍රාග්ධනය	රු. 25 000
C - වර්ෂයේ අලාභය	රු. 60 000
D - ණය ගැනීම්	රු. 30 000

2023.03.31 දින මූල්‍ය තත්ව ප්‍රකාශ සමීකරණය පහත සඳහන් කුමකින් නිරූපනය කරයිද?

	මුළු වත්කම (රු.)	**මුළු වගකීම් (රු.)**		**හිමිකම (රු.)**
(1)	120 000	80 000	+	40 000
(2)	120 000	30 000	+	90 000
(3)	190 000	80 000	+	110 000
(4)	200 000	50 000	+	150 000
(5)	310 000	50 000	+	260 000

(.....)

11. තොග අයිතම තුනක් සඳහා 2023.03.31 දිනට පහත සඳහන් තොරතුරු සමාගම විසින් සපයා ඇත.

අයිතමය	**නිෂ්පාදන පිරිවැය**	**අපේක්ෂිත විකුණුම් ආදායම**	**අපේක්ෂිත විකුණුම් වියදම**
A	13 000	15 000	5 000
B	10 000	16 000	4 000
C	17 000	19 000	7 000

අයිතම් ක්‍රමයට 2023.03.31 දිනට තොගයේ වටිනාකම කුමක්ද ?

(1) රු. 32 000 (2) රු. 34 000 (3) රු. 40 000 (4) රු. 42 000 (5) රු. 50 000

(.....)

12. සුළු මුදල් අග්‍රිම ක්‍රමය භාවිතා කරන ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය රු.10 000 කි. මාසය ආරම්භයේදීම අග්‍රිමය ප්‍රතිපූර්ණය කරන අතර ජනවාරි සහ පෙබරවාරි මාස දෙක සඳහා වෙන වෙනම ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුවෙත ප්‍රතිපූර්ණ කර ඇති මුළු මුදල රු.16 000 කි. පෙබරවාරි මාසය ආරම්භයේ දී රු.1 200 ක් සුළු මුදල් භාරකරු අත ඉතිරිව තිබූ අතර, ජනවාරි මාසය ආරම්භයේදී ප්‍රතිපූර්ණයට පෙර සුළු මුදල් භාරකරු සතු මුදල වන්නේ,

(1) රු. 2 800 (2) රු. 2 200 (3) රු. 2 400 (4) රු. 1 800 (5) රු. 4 000

(.....)

13. රවිදුගේ ව්‍යාපාරයේ 2023.03.31 දිනට වෙළඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුමේ ශේෂය රු.44 000 ක් විය. එදිනට වෙළඳ ගෙවිය යුතු දෑ ශේෂ ලැයිස්තුවේ එකතුව වෙළඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුමේ ශේෂයට සමාන නොවිය. පසුව කරන ලද විමර්ෂණයේදී පහත හේතු අනාවරණය විය.

A - චෙක්පතක් අගරු වීම නිසා රු.2 000ක ලද වට්ටම් අහිමි කිරීමක් වෙළඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුමට හර කර ඇත.

B - රු.5 000 ක ලද වට්ටමක් රු.500 ක් ලෙස අදාළ වෙළඳ ගෙවිය යුතු දෑ ගිණුමේ හරට සටහන් කර ඇත

C - රු.18 000ක ගැණුම් ඉන්වොයිසියක් අදාල වෙළඳ ගෙවිය යුතු දෑ ගිණුමට රු.8 000ක් ලෙස සටහන් කර ඇත

2023.03.31 දිනට නිවැරදි කරන ලද වෙළඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුමේ ශේෂය හා නිවැරදි කිරීමට පෙර වෙළඳ ගෙවිය යුතු දෑ ගිණුම් ශේෂ ලැයිස්තුවේ එකතුව පිළිවලින්,

(1) රු.42 000 හා 36 500 කි. (2) රු.43 500 හා 58 000 කි. (3) රු.46 000 හා 38 500 කි.
(4) රු.48 000 හා 42 500 කි. (5) රු.48 000 හා 53 500 කි.

(.....)

14. ගනුදෙනු හා සිද්ධි වාර්තා කිරීමේ දී ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් බැහැර විය හැකි අවස්ථාවක් ලෙස හඳුනා ගත හැක්කේ,

(1) LKAS-16 (දේපල පිරියත උපකරණ) ප්‍රමිතියට අනුව යන්ත්‍රයක් මුල්වරට හඳුනා ගැනීමේ දී මිණුම් කරන විටය.
(2) FIFO ක්‍රමයට තොග අගය කරන විටය.
(3) LKAS-2 (තොග) ප්‍රමිතියට අනුව වසර අග තොගය අගය කිරීමේ දී.
(4) සේවක වැටුප් වාර්තා කරන විටය.
(5) නැවත විකිණීමේ පරමාර්ථයෙන් භාණ්ඩ ණයට ගැනීමේදී.

(.....)

15. නදීරා ව්‍යාපාරය ගෙවල් කුලියට දීමෙන් ආදායම් උපයා ගනී. 2023.03.31 සහ 2022.04.01 දිනට ගිණුම් ශේෂ පහත දැක්වේ.

	2023.03.31 (රු.)	2022.04.01 (රු.)
A - ලැබූ කුලී අත්තිකාරම්	250 000	200 000
B - ලැබිය යුතු කුලී අත්තිකාරම්	350 000	400 000

2023.03.31 දිනෙන් අවසන් වසර තුළ මුළු කුලී ලැබීම් රු.1 300 000 කි. 2023.03.31 දිනෙන් අවසන් වසරට අදාළ කුලී ආදායම වන්නේ,

(1) රු.110 000 (2) රු.155 000 (3) රු.1 200 000 (4) රු.1 300 000 (5) රු.1 450 000

(.....)

16. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ආයතනයක් පහත තොරතුරු සපයා ඇත

	(රු.)
නොනිමි තොග - 2022.04.01	7 000
- 2023.03.31	10 000
භාවිතා කරන ලද සෘජු ද්‍රව්‍ය	3 000
සෘජු ශ්‍රමය	2 000
කම්හල් පොදුකාර්ය	2 000
කම්හල් නොවන පොදුකාර්ය	4 000
විකුණුම් කොමිස්	1 000

නිෂ්පාදනය කළ භාණ්ඩවල පිරිවැය කොපමණද ?

(1) රු.8 000 (2) රු.4 000 (3) රු.5 000 (4) රු.6 000 (5) රු.7 000

(.....)

17. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව මඟින් මූල්‍ය ප්‍රකාශන මූලිකාංග මැනීමේ දී යොදාගත හැකි යැයි නිර්දේශිත පදනමක් නොවන්නේ මින් කවරේ ද ?

(1) ප්‍රයෝජ්‍ය අගය. (2) ඓතිහාසික පිරිවැය. (3) ප්‍රවර්තන පිරිවැය.
(4) ශුද්ධ උපලබ්ධි අගය. (5) සාධාරණ අගය.

(.....)

18. A, B හා C පිළිවලින් 3 : 2 : 1 අනුපාතයට ලාභ - අලාභ බෙදා ගනිමින් පවත්වා ගෙන ගිය හවුල් ව්‍යාපාරයෙන් 2023.03.31 දින C විශ්‍රාම ගන්නා ලදී. C ට කීර්තිනාම කොටස ලෙස රු.60 000 ක් ලැබුණි. නව ලාභ බෙදා ගැනීමේ අනුපාතය A හා B පිළිවෙලින් 2 : 1 විය. 2023.03.31 දිනට ව්‍යාපාරයේ මුළු කීර්ති නාමය හා A හා B ගේ බුක්ති විඳීමේ අනුපාතය වන්නේ,

	මුළු කීර්තිනාමය	**බුක්ති අනුපාතය**
(1)	180 000	1 : 0
(2)	120 000	2 : 1
(3)	360 000	1 : 0
(4)	300 000	1 : 2
(5)	480 000	3 : 2

(.....)

19. අනිල් හා බැසිල් පිළිවෙලින් 3 : 2 අනුපාතයට ලාභ අලාභ බෙදා ගන්නා හවුල් ව්‍යාපාරයට, සිසිල් 2022.4.01 දින බඳවා ගන්නා ලදී. සිසිල් කීර්තිනාමය හා ප්‍රාග්ධනය සඳහා රැගෙන ආ මුදල් පිළිවෙලින් රු. 200 000 හා රු.800 000 වේ.

2022.04.01 දිනට ගිණුම් ශේෂ පහත පරිදි වේ.

	අනිල් (රු.'000)	**බැසිල් (රු.'000)**
ප්‍රාග්ධන ගිණුම	1 000	600
ජංගම ගිණුම	200	100

සියලුම හවුල්කරුවන්ට රු. 100 000 ක් වාර්ෂිකව හවුල් වේතන හිමිවන අතර, ගලපන ලද ප්‍රාග්ධන ශේෂ මත පොලී අනුපාතය 10%. කාලච්ඡේදයේ ලාභය රු. 810 000 ක් වේ. 2023.03.31 දිනට අනිල්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය, බැසිල්ගේ ජංගම ගිණුමේ ශේෂය වන්නේ,

	ප්‍රාග්ධන ගිණුම (රු.'000)	**ජංගම ගිණුම (රු.'000)**
(1)	1 160	506
(2)	640	354
(3)	800	260
(4)	1 160	354
(5)	640	496

(.....)

20. වෙළඳ ලැබිය යුතු දෑ හා වෙළඳ ගෙවිය යුතු දෑ හඳුනා ගැනීම සඳහා භාවිත කරන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

(1) උපචිත (2) ප්‍රමාණාත්මක (3) ගැලපුම් (4) ආරක්ෂණ (5) කාලච්ඡේද

(.....)

21. හිමාලිගේ ව්‍යාපාරය බරිත සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමය මත තොග අගය කරන අතර, 2023.04.01 දිනට තොගයේ පිරිවැය රු. 375 000 ක් වූ අතර, එහි තොග ඒකක 15 000 ක් තිබුණි. 2023.04.16 දිනට ව්‍යාපාරයේ ඉතිරි තොගයේ වටිනාකම රු. 875 000 ක් විය.

4/1 දින සිට 4/16 දින දක්වා අත්පත් කර ගත් තොග ඒකක ගණන 20 000 ක් විය. 4/20 දින තොග ඒකක 18 000 ක් විකුණන ලද්දේ නම්, 2023 අප්‍රේල් මාසයේ විකුණුම් පිරිවැය හා 4/30 දිනට අවසන් තොගයේ පිරිවැය පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,

	විකුණුම් පිරිවැය රු.'000	**අවසන් තොගය රු.'000**
(1)	375	425
(2)	450	100
(3)	375	500
(4)	450	425
(5)	450	375

(.....)

22. සීමිත මල්මි පොදු සමාගම එකතු කරගත් අගය මත බදු (VAT) අය කිරීම සඳහා ලියාපදිංචි ව්‍යාපාරයකි. 2023.01.01 දින VAT රහිත ලකුණු කළ මිල රු. 1 500 000 ක් වූ යන්ත්‍රයක් ආනයනය කළ අතර, එහිදී අඩු කළ වෙළඳ වට්ටම 8% කි.
යන්ත්‍රයට අදාළව පහත තොරතුරු ද සපයා ඇත.

	රු.'000
ආනයන බදු	44
ගෙන ඒමේ වියදම	52
සවිකිරීමේ ව්‍යෘත්තීය ගාස්තු	24
වාර්ෂික නඩත්තු පිරිවැය	128
ස්ථාපනය සහ වැඩ බිම සැකසීමේ පිරිවැය	240
මූලික පරීක්ෂණයේ පිරිවැය	
- ද්‍රව්‍ය සඳහා	38
- ශ්‍රමය සඳහා	22
පළමු වර්ෂයේ මෙහෙයුම් අලාභය	35

❖ මූලික අත්හදා බැලීමේ පරීක්ෂණයේ දී නිපද වූ භාණ්ඩ අලෙවියෙන් රු. 24 000 ක ආදායමක් උපයා ගෙන ඇත.

LKAS – 16 (දේපළ පිරියත හා උපකරණ) ප්‍රමිතයට අනුව යන්ත්‍රයේ මූලික හඳුනා ගැනීමේ පිරිවැය වන්නේ,

(1) රු. 1 904 000 කි. (2) රු. 1 939 000 කි. (3) රු. 1 868 000 කි.
(4) රු. 1 776 000 කි. (5) රු. 1 740 000 කි.

(.....)

23. එකම කාලච්ඡේදයක් තුල සමාගමක ක්‍රියාකාරී මට්ටම් දෙකක අයවැයගත නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය පහත දී ඇත.

ක්‍රියාකාරී මට්ටම (ඒකක)	**අයවැයගත නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය (රු.)**
30 000	225 000
40 000	275 000

ඒකකයක ප්‍රාථමික පිරිවැය රු.10 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ක්‍රියාකාරී මට්ටම් ඒකක 40 000 ක් වන විට මුළු විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය සහ මුළු නිෂ්පාදන පිරිවැය

	මුළු විචල්‍ය නිෂ්පාදිත පොදුකාර්ය පිරිවැය (රු.)	**මුළු නිෂ්පාදන පිරිවැය (රු.)**
(1)	50 000	525 000
(2)	50 000	675 000
(3)	200 000	675 000
(4)	200 000	825 000
(5)	275 000	675 000

(.....)

24. පහත තොරතුරු වර්ෂයක් තුළ දී සමාගමක් විසින් භාවිතා කළ 'A' නැමැති අමුද්‍රව්‍යට අදාළ වේ.

	අවම	**උපරිම**
පරිභෝජනය (ඒකක)	2 000	5 000
පොරොත්තු කාලය (මාස)	04	06

උපරිම තොග මට්ටම් ඒකක 42 000 කි.

මෙම අමුද්‍රව්‍යයේ යළි ඇණවුම් මට්ටම සහ යළි ඇණවුම් ප්‍රමාණය

	යළි ඇනවුම් මට්ටම (ඒකක)	**යළි ඇණවුම් ප්‍රමාණය (ඒකක)**
(1)	17 500	32 500
(2)	20 000	30 000
(3)	20 000	39 500
(4)	30 000	20 000
(5)	30 000	29 500

(.....)

25. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමක ආදායම් ප්‍රකාශයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

විකුණුම්	රු. 4 000 000
වර්ෂයේ ලාභය	රු. 200 000
පොළී වියදම	රු. 60 000
ආදායම් බදු වියදම	රු. 40 000

2023.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සහ පොළී ආවරණ අනුපාතය කොපමණද?

	ශුද්ධ ලාභ අනුපාතය (%)	**පොළී ආවරණ අනුපාතය (වාර)**
(1)	5	3.3
(2)	5	5
(3)	6	4
(4)	6	5
(5)	7.5	4

(.....)

26. සීමිත විපුල් පොදු සමාගමේ 2023.03.31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන 2023.06.05 දින අධ්‍යක්ෂකවරු විසින් අනුමත කර ඇති අතර, 2023.06.30 දින පැවති මහ සභා රැස්වීමේ දී ඒවා කොටස් හිමියන් විසින් සම්මත කරන ලදී.

සමාගමට අදාළව පහත සිදුවීම් වාර්තා වී ඇත.

A - 2023.03.31 දිනට පැවති නඩුවක් වෙනුවෙන් වෙන්කර තිබූ වන්දි උපයෝගී කර ගනිමින් 2023.04.18 ලබා දුන් අධිකරණ තීන්දුව මත රු. 260 000 ක් මුදලින් ගෙවා දැමීම.

B - 2023.4.08 සිදු කළ විකුණුම් මත ඇති වූ රු. 78 000 ක වෙළඳ ලැබිය යුතු දෑ බුන්වත් වූ බව 2023.05.25 දින ලබාදුන් නඩු තීන්දුවකින් තහවුරු වීම.

C - 2023.03.20 අත්පත් කර ගත් රු. 800 000 ක වෙළඳ ආයෝජනයක 2023.05.10 දිනට වෙළඳපොල වටිනාකම රු. 1 260 000 ක් බව ඇස්තමේන්තු කර ඇත.

D - 2023.03.31 දිනට වෙළඳ බඩු තොගයේ පිරිවැය රු. 128 000 ක් වූ අතර, මෙම සම්පූර්ණ තොගය 2023.06.12 දින රු. 150 000 කට විකුණා ඇත.

LKAS – 10 (වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව 2023.03.31 දිනෙන් අවසන් වසරේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කළ යුතු සිදුවීම / සිදුවීම් වන්නේ,

(1) A හා B පමණි. (2) A, B හා C පමණි. (3) A පමණි.
(4) B,C හා D පමණි. (5) A, B C හා D යන සියල්ල ම.

(.....)

27. SLFRS – 15 (ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් මඟින් ඇති වන අයභාරය) ප්‍රමිතය අනුව පහත කුමන ප්‍රකාශය නිවැරදි වේ ද?

(1) එකිනෙකට සම්බන්ධිත කාර්ය සාධන බැඳීම් පවතී නම් ඒවා ඒකරාශී කොට තනි බැඳීමක් ලෙස හඳුනාගත යුතු ය.

(2) ගිවිසුම ඇති වූ දිනය ලෙස හඳුනා ගන්නේ ගනුදෙනුකරු ගිවිසුමේ සඳහන් ප්‍රතිශ්‌යාව මුදලින් ගෙවූ දිනයේ දී ය.

(3) සියලු කාර්ය සාධන බැඳීම් ඉටු කළ පසු පමණක් මුළු අයභාරය හඳුනාගත හැක.

(4) ගනුදෙනුවක මිල තීරණය වන්නේ භාණ්ඩය හෝ සේවාවට අදාළ අවදානම් හා ප්‍රතිලාභ ගනුදෙනුකරු වෙත මාරු වීමෙන් පසුව ය.

(5) ගිවිසුමක් වලංගු ගිවිසුමක් වීමට දෙපාර්ශවය ම එය අනුමත කර තිබීම ප්‍රමාණවත් වේ.

(.....)

28. සීමිත ජයසිංහ පොදු සමාගමේ 2022.04.01 දිනට පහත ශේෂයන් දැකිය හැකි විය.

	රු.'000
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස්)	4 000
පොදු සංචිතය	1 000
රඳවාගත් ඉපයුම්	2 150

- එදිනට කොටසක සාමාන්‍ය වටිනාකම රු. 25/- කි.
- 2022.05.01 දින එදිනට පැවති සෑම සාමාන්‍ය කොටස් හතරකට ම එක බැගින් කොටසකට රු. 20 ක ප්‍රතිශ්ඨාවක් මත හිමිකම් නිකුතුවක් සිදුකර ඇත. මින් 75% ක් කොටස් හිමියන් විසින් භාරගෙන මුදල් ගෙවා ඇත.
- 2022.10.01 දින සමාගමේ ඉඩම් ප්‍රථමවරට ප්‍රත්‍යාගණනය කර ඇත. එහිදී හඳුනාගත් අතිරික්තය රු. 350 000 කි.
- 2023.03.31 දිනෙන් අවසන් වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම රු. 750 000 කි.
- 2023.03.31 දින රු. 150 000 ක් පොදු සංචිතයට මාරු කිරීමට එකඟ විය.
- තවද වර්ෂය තුළ දී රු. 300 000 ක අතුරු ලාභාංශ ගෙවා ඇති අතර, අධ්‍යක්ෂකවරුන් සාමාන්‍ය කොටස් හිමියන් ට රු. 350 000 අවසාන ලාභාංශයක් ප්‍රකාශයට පත්කර ඇත.

2023.03.31 දිනට ජයසිංහ සමාගමේ රඳවාගත් ඉපයුම් වටිනාකම සහ මුළු හිමිකම දැක්වෙන පිළිතුර වන්නේ,

	රඳවාගත් ඉපයුම් (රු.'000)	**මුළු හිමිකම (රු.'000)**
(1)	2 100	8 540
(2)	1 850	8 340
(3)	2 100	8 340
(4)	2 100	8 200
(5)	2 450	8 200

(.....)

29. සමාගමක් නිෂ්පාදනය සඳහා භාවිතා කරන පැරණි යන්ත්‍රය වෙනුවට අලුත් යන්ත්‍රයක් ආදේශ කිරීමට සලකා බලමින් සිටී. මෙම පැරණි යන්ත්‍රයේ මෙන්ම නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වසර 4කි. පහත තොරතුරු දී ඇත.

විස්තරය	**පැරණි යන්ත්‍රය (රු.)**	**නව යන්ත්‍රය (රු.)**
ගැණුම් මිල	9 000	10 000
වර්තමාන විකුණුම් වටිනාකම	4 000	-
4 වන වසරේදී අපේක්ෂිත සුන්බුන් අගය	-	2 000
වාර්ෂික මෙහෙයුම් පිරිවැය (ක්ෂය නොමැතිව)	4 500	3 000

නව යන්ත්‍රය මිලදී ගන්නේ නම් ආරම්භක මුදල් ගලා යෑම සහ 4 වන වර්ෂයේ මුදල් ගලා ඒම,

	ආරම්භක ශුද්ධ මුදල් ගලායෑම (රු.)	**4 වන වර්ෂයේ මුදල් ගලා ඒම (රු.)**
(1)	5 000	3 500
(2)	6 000	1 500
(3)	6 000	3 500
(4)	10 000	1 500
(5)	10 000	3 500

(.....)

30. ව්‍යාපාරයක් 2023 මාර්තු මාසයට අදාළව පහත ඇස්තමේන්තුගත තොරතුරු සපයා ඇත.
    - නිෂ්පාදිත ඒකක ගණන 9 600
    - ඒකකයක නිෂ්පාදන පිරිවැය රු. 300
    - ප්‍රාථමික පිරිවැය මුළු නිෂ්පාදන පිරිවැයෙන් 50% කි.
    - යන්ත්‍ර පැය පදනමට පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කෙරේ.
    - මාසයට අදාළ ඇස්තමේන්තුගත යන්ත්‍ර පැය ගණන 5 000 කි.

නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය වන්නේ මින් කවරක් ද?

(1) රු. 72 (යන්ත්‍ර පැයකට) (2) රු. 150 (යන්ත්‍ර පැයකට) (3) රු. 144 (යන්ත්‍ර පැයකට)
(4) රු. 288 (යන්ත්‍ර පැයකට) (5) රු. 576 (යන්ත්‍ර පැයකට)

(.....)

❖ **ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට කෙටි හා නිශ්චිත පිළිතුරු සපයන්න.**

31. ආයතනයක කළමනාකරණ ගිණුම්කරණයේ කාර්ය භාරයට අදාළව පහත ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න.

ප්‍රකාශය	**සත්‍ය / අසත්‍ය**
A - එය ආයතනයක ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීමට තොරතුරු සපයයි.	.....
B - එය ආයතනයක් පිළිබඳ අතීත හා අනාගත තොරතුරු සපයයි	.....
C - එය ගිණුම්කරණ ප්‍රමිති මගින් නියම කරන තොරතුරු සපයයි	.....
D - එය ආයතනයේ කළමනාකරුවන්ට තීරණ ගැනීමට තොරතුරු සපයයි	.....

32. ව්‍යාපාරයක 2023.03.31 දිනට වගකීම් රු. 240 000 ක් වූ අතර, මාර්තු මාසය තුළ වගකීම්වල වැඩිවීම් රු. 80 000 කි. 2023.03.31 දිනට ව්‍යාපාරයේ වත්කම් රු. 700 000 කි.
මාසය තුළ අයිතිකරුගේ ගැනිලි රු. 10 000 ක්වූ අතර, මාසය තුළ ඉපයූ ශුද්ධ ලාභය රු. 65 000 ක් වේ. මාර්තු මාසයට අදාළ ව්‍යාපාරයේ විදුලි බිල රු. 22 000 ක් අයිතිකරු තම පුද්ගලික මුදලින් ගෙවා ඇත.

ඉහත තොරතුරු අනුව,
අ) 2023 මාර්තු මස 01 දිනට ව්‍යාපාරයේ වත්කම්වල වටිනාකම කොපමණ ද? රු. .....
ආ) රඳවාගත් ඉපයුම් රු. .....

33. පහත ගිණුම් මූල්‍ය ප්‍රකාශ වල කුමන මූලිකාංගයට අයත් වන්නේ දැයි දක්වන්න.

	මූලිකාංගය
A - හානි කරන අලාභ සඳහා ඉඩ හැරීම	.....
B - සාමාජික මුදල්	.....
C - මෝටර් රථ ක්ෂය	.....
D - කල්බදු ණයහිමියෝ	.....

34. නිෂ්පාදන ව්‍යාපාරයක භාවිත කරන අමුද්‍රව්‍ය සඳහා පහත තොරතුරු සපයා ඇත.
- වාර්ෂික ඉල්ලුම ඒකක 3 200
- ආර්ථික ඇණවුම් ප්‍රමාණය - EOQ ඒකක 200
- අමුද්‍රව්‍ය ඒකක ගැනුම් මිල රු. 1 000
- වාර්ෂික රඳවා ගැනීමේ පිරිවැය, අමුද්‍රව්‍ය ඒකකයක පිරිවැය 20%

ඉහත තොරතුරු අනුව,
(අ) ඇණවුමකට අදාළ පිරිවැය රු. .....
(ආ) EOQ ආකෘතියට අනුව ඇණවුම කරන්නේ නම්, වාර්ෂික මුළු ඇණවුම් පිරිවැය, වාර්ෂික තොග රඳවා ගැනීමේ පිරිවැය.
.....

35. ලීබඩු කර්මාන්ත ශාලාවක පහත සඳහන් එක් එක් අවස්ථාවට වඩාත් අදාළවන ගිණුම්කරණ සංකල්පය දක්වන්න.

	ගිණුම්කරණ සංකල්පය
1) ලී තොගය ජංගම වත්කම් ලෙසත්, ලී ඉරන මැෂින් ජංගම නොවන වත්කම් ලෙසත් වර්ග කිරීම.	.....
2) වර්ෂය තුළ ගෙවූ කර්මාන්තශාලා කුලියෙන් කොටසක් ඉදිරියට කළ ගෙවීමක් ලෙස හඳුනා ගැනීම.	.....
3) වර්ෂය අවසාන ලී තොගය පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට අගය කිරීම.	.....
4) භාණ්ඩ විකුණන අවස්ථාවේ දී විකුණුම් ආදායම හඳුනා ගැනීම	.....

36. හවුල් ව්‍යාපාරයක ගිණුම් තැබීමට අදාළ පහත ප්‍රකාශන **සත්‍ය ද අසත්‍යද** යන්න දක්වන්න.

ප්‍රකාශය	**සත්‍ය / අසත්‍ය**
A - හවුල්කරුවන්ට ගෙවන ප්‍රාග්ධන පොලිය අවම වශයෙන් වර්ෂයකට 5% ක් විය යුතු වේ.	.....
B - හවුල්කරුවන් ප්‍රාග්ධනයට අමතරව සපයන ණය සඳහා ගෙවන පොලිය හවුල් ආඥා පනතේ 42 වගන්තියට අනුව තීරණය කෙරේ.	.....
C - හවුලක අයිතිය වෙනස්වීමක දී කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුමෙන් ගැලපීම නිසා හවුල්කරුවන්ගේ මුළු හිමිකම වෙනස් නොවේ.	.....
D - හවුල්කරුවන් ව්‍යාපාරයට ණයක් සපයා ඇති විට ඊට ගෙවන පොලිය ලාභ විසර්ජනයක් ලෙස නොසැලකේ.	.....

37. සීමාසහිත සම්පත් සමාගම මෝටර් රථ විකිණීම හා පහත සේවා සැපයීම සඳහා ගනුදෙනුකරුවෙක් වන විපුල සමඟ රු. 10 000 000/- මුළු ප්‍රතිශ්ඨාවකට 2022.07.01 දින ගිවිසුමකට එළඹෙන ලදී. එකිනෙක කාර්යසාධන බැඳීම්වල තනි විකිණුම් මිල පහත පරිදි වේ.

	රු.'000
මෝටර් රථය	9 600
සේවා වාර දෙකක් සැපයීම	1 800
විදේශ සංචාරයක් ලබා දීම	600

2023.01.01 දින මෝටර් රථය සම්පත් සමාගම විපුලට භාරදුන් අතර, 2023.02.03 දින විදේශ සංචාරය ද ලබා දෙන ලදී. 2023.03.31 එක් සේවා වාරයක් විපුල විසින් ලබා ගෙන ඇත.

ඉහත තොරතුරු අනුව,

(අ) 2023.03.31 දිනට හඳුනාගත යුතු මුළු අයභාරය රු.'000 .....

(ආ) 2023.03.31 දිනට නොඉපයූ ආදායම රු.'000 .....

(ඉ) අයභාරය හඳුනා ගැනීමට අදාළ ගිණුම්කරණ සංකල්පය .....

38. සීමිත විශ්ව 2022.04.01 දින LOLC සමාගමෙන් භාවිත අයිතිය සඳහා යන්ත්‍ර ලබා ගන්නා අතර, කල්බදු කාලය වසර 03 කි. 2022.04.01 දින මූලික ගෙවීම ලෙස රු. 1 000 000 ගෙවූ අතර, සවි කිරීමේ පිරිවැය රු. 110 000 සීමිත විශ්ව සමාගම විසින් දරණ ලදී. 2023.03.31 දිනෙන් ආරම්භ කර වාර්ෂික වාරිකයක් රු. 1000 000 බැගින් වාරික 03 ක් ගෙවිය යුතුය. කල්බදු ගැනුම්කරු වසර 03 ක් අවසානයේ යන්ත්‍රය ගලවා ඉවත් කිරීමේ පිරිවැයේ වර්තමාන අගය රු.90 000 කි. කල් බද්දේ ගම්‍ය පොලී අනුපාතය 10% වන අතර, එම පොලී අනුපාතය යටතේ වට්ටම් සාධකය පහත පරිදි වේ.

වර්ෂය	1	2	3
වට්ටම් සාධකය	0.9	0.8	0.7

ඉහත තොරතුරු අනුව,

(අ) භාවිත අයිතිය ඇති යන්ත්‍ර වටිනාකම රු.'000 .....

(ආ) 2022.04.01 දින කල්බදු වගකීම (කල්බදු වෙළඳ ගෙවිය යුතු දෑ) වටිනාකම රු.'000 .....

39. LKAS – 37 (ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව **''ප්‍රතිපාදනයක්''** යන්න හඳුන්වා ප්‍රතිපාදනයක් සහ අසම්භව්‍ය වගකීමක් අතර වෙනස්කම් 02 ක් ලියා දක්වන්න.

.....

.....

40. (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කල හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.

.....

.....

(ආ) මූල්‍ය වාර්තාකරණ සංකල්පනාත්මක රාමු අනුව මූල්‍ය ප්‍රකාශන මූලිකාංග හඳුනා ගැනීමට සම්පූර්ණ විය යුතු මූලික ලක්ෂණ මොනවා ද?

.....

.....

41. පහත සඳහන් තොරතුරු ක්‍රීඩා සමාජයක සාමාජික මුදල් හා බැඳේ

විස්තරය	**2023.03.31 දිනට (රු.)**	**2022.03.31 දිනට (රු.)**
කලින් ලද සාමාජික මුදල්	80 000	60 000
හිඟ සාමාජික මුදල්	30 000	20 000

සාමාජිකයෙකු ගේ වාර්ෂික සාමාජික මුදල රු.10 000 කි.

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී සාමාජිකයින් 60 දෙනෙකු විය.

2022.04.01 දින හිඟහිටි සාමාජිකයින් දෙදෙනෙකු සාමාජික මුදල් නොලැබීම නිසා සාමජිකත්වයෙන් ඉවත් කරන ලදී.

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ ගණනය කරන්න.

(1) ප්‍රවර්තන වර්ෂයේ සාමාජික මුදල් ආදායම රු. .....

(2) මුදලින් ලද සමාජික මුදල් රු. .....

42. සීමිත රන්වැලි පොදු සමාගමේ 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ඔබට සපයා ඇත.

	රු.'000
කාලච්ඡේදයේ ලාභය	1 800
වාර්ෂික ක්ෂය	100
මෝටර් රථ ඉවත් කිරීමේ ලාභය	300
ආදායම් බදු වියදම	200
ජංගම වත්කම්වල වැඩි වීම.	30
ජංගම වගකීම්වල වැඩි වීම	60
කාලච්ඡේදය තුළ ආදායම් බදු - වෙන් කිරීමේ වැඩි වීම	40
පොලී වියදම	75

❖ 2022.04.01 දිනට උපචිත පොලී වියදම රු. 25 000 ක් වූ අතර, 2023.03.31 දිනට උපචිත පොලී නොමැත.

සමාගමේ 2023.03.31 දිනෙන් අවසන් වසර සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද? රු. .....

43. සීමිත දිළිණි සමාගමට අදාළව පහත තොරතුරු සපයා ඇත.

	2023.03.31 රු.'000	2022.04.01 රු.'000
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස්)	14 000	11 000
ප්‍රත්‍යාගණන සංචිතය	1 500	-
පොදු සංචිතය	3 000	2 400
රඳවාගත් ඉපයුම්	12 800	7 200
මුළු හිමිකම	31 300	20 600

❖ වර්ෂය තුළ දී රු.1 600 000 ක අතුරු ලාභාංශ ගෙවා ඇති අතර, වර්ෂයේ බදු වියදම රු.745 000 කි.

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මුළු විස්තීරණ ආදායම වන්නේ, රු. .....

44. සදුසු තීරුවේ ✓ ලකුණ යොදමින් නිෂ්පාදන සමාගමක පහත ගනුදෙනු තුළින් ඇතිවන මුදල් ප්‍රවාහයන් LKAS-7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශ) ප්‍රමිතියට අනුව මෙහෙයුම්, ආයෝජන සහ මූල්‍ය යටතේ වර්ග කරන්න.

	ගනුදෙනුව	මෙහෙයුම්	ආයෝජන	මූල්‍ය
1	කල්බදු වාරිකයක ණයහිමි කොටස ගෙවීම			
2	ස්ථාවර තැන්පතු පොලී ලැබීම			
3	වෙළඳ ණයහිමියන්ට මුදල් ගෙවීම			
4	ආදායම් බදු ගෙවීම්			

45. පහත එක් එක් අවස්ථාවේ සමාගමක ණය - හිමිකම් අනුපාතය වැඩිවේ /අඩුවේ / වෙනස් නොවේ යනුවෙන් දක්වන්න.

අවස්ථාව	ණය - හිමිකම් අනුපාතය මත බලපෑම
A - වත්කම් ඉහල අගයකට ප්‍රත්‍යගණන කිරීම	.....
B - දිගු කාලීන ණයක් ලබා ගැනීම	.....
C - ණයට භාණ්ඩ මිලට ගැනීම	.....
D - නව කොටස් නිකුතුවක් සිදු කිරීම	.....

46. සීමිත සමාගමක් වසරක කාලසීමාවන් සඳහා වගකීම් සහතිකයක් සහිතව විකුණුම් සිදු කරයි. 2022.04.01 දිනට වගකීම් සහතික සඳහා වෙන් කිරීමේ ශිෂ්ෂයේ බැර ශේෂය රු. 76 000 කි. 2022/2023 වර්ෂය තුළ දී වගකීම් සහතික වෙනුවෙන් කරන ලද ගෙවීම් රු. 57 000 කි. 2022/2023 වර්ෂයේ විකුණුම් රු. 3 200 000 ක් වූ අතර, ආපසු එවුම් රු. 180 000 කි. විකුණුම්වලින් 2% ක් වගකීම් සහතික වෙනුවෙන් වෙන්කළ යුතු යැයි විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කර ඇත.

අ) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු වගකීම් සහතික වියදම කොපමණ ද?
රු. .....

ආ) 2023.03.31 දිනට වගකීම් සහතික සඳහා වෙන්කිරීම කොපමණ ද?
රු. .....

47. නිෂ්පාදන සමාගමක පිරිවැය දත්ත පහත දී ඇත.

සෘජු අමුද්‍රව්‍ය	ඒකකයකට	රු. 15
සෘජු ශ්‍රමය	ඒකකයකට	රු. 25

විචල්‍ය පොදු කාර්ය පිරිවැය

නිෂ්පාදන	ඒකකයකට	රු. 10
නිෂ්පාදන නොවන	ඒකකයකට	රු. 15

ස්ථාවර පොදු කාර්ය පිරිවැය

නිෂ්පාදන	රු.50 000
නිෂ්පාදන නොවන	රු.30 000

ඉලක්ක නිෂ්පාදනය ඒකක 1 000 දී පහත දෑ ගණනය කරන්න

(අ) මුළු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය .....

(ආ) මුළු පොදු කාර්ය පිරිවැය .....

(ඉ) මුළු විචල්‍ය පිරිවැය .....

48. ශ්‍රියාලතා ව්‍යාපාරයේ 2023 අගෝස්තු මාසයට අදාළ තොරතුරු පහත දැක්වේ.

දිනය	විස්තරය
08.01	ශේෂය ඒකක 1 000 ඒකකයක මිල රු. 20/-
08.05	මිලදී ගැනීම් 5 000 ඒකකයක මිල රු. 30/-
08.20	මිලදී ගැනීම් 10 000 ඒකකයක මිල රු. 40/-
08.30	නිකුත් කිරීම් 12 000

ඉහත තොරතුරු අනුව අමුද්‍රව්‍ය,

තොග පිරිවැය මැනීමේ ක්‍රමය	අමුද්‍රව්‍ය පරිභෝජනය	2023.08.31 අමුද්‍රව්‍ය තොගය
(අ) ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය FIFO	.....	.....
(ආ) හරිත සාමාන්‍ය මිල ක්‍රමය (AC)	.....	.....

49. නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන මට්ටම් දෙකකට අදාළව පහත තොරතුරු සපයා ඇත.

ඒකක ගණන	මුළු පිරිවැය (රු.)
1 500	42 000
2 600	50 800

ලාභ පරිමා අනුපාතය 75% ක් නම්,

අ) ඒකකයක විකුණුම් මිල රු. .....

ආ) සම්චිඡේදන ලක්ෂ්‍යය ඒකක .....

ඉ) විකුණුම් ඒකක 5 000 කදී ආරක්ෂිත ආන්තිකය රු. .....

ඊ) විකුණුම් ඒකක 5 000 ක දී ලාභය රු. .....

50. පහත සඳහන් තොරතුරු ව්‍යාපෘතියකට අදාලවේ

විස්තරය	රු.
සාමාන්‍ය වාර්ෂික ලාභය	90 000
සාමාන්‍ය ආයෝජන	300 000
මුදල් ප්‍රවාහ ගලා ඒම්වල වර්තමාන අගය	400 000
මුදල් ප්‍රවාහ ගලා යෑම්වල වර්තමාන අගය	500 000
අපේක්ෂිත ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය	25%

පහත එක් එක් ක්‍රමය යටතේ මෙම ව්‍යාපෘතිය පිළිගත යුතුද නැද්ද යන්න හේතුව සමගින් දක්වන්න.

ක්‍රමය	පිළිගනී (✓) පිළිනොගනී (✗)	හේතුව
ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය		
ශුද්ධ වර්තමාන අගය		

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 33 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2023
උපකාරක ප්‍රශ්න පත්‍ර

විෂයය - ගිණුම්කරණය | පත්‍රය - II | කාලය - පැය 03

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි. අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

උපදෙස් -

පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් හිමි වේ.

1. සීමිත සුමුදු පොදු සමාගමේ 2023.03.31 දිනට පිළියෙල කරන ලද සාරාංශගත ශේෂ පිරික්සුම පහත වේ.

විස්තරය	හර (රු.'000)	බැර (රු.'000)
2023.03.31 තොගය	3 215	-
විකුණුම්	-	63 500
විකුණුම් පිරිවැය	31 400	-
දේපළ, පිරියත හා උපකරණ (ධාරණ අගය)	67 550	-
භාවිත අයිති ඇති වත්කම්	6 000	-
කල්බදු වගකීම්	-	5 500
වෙළඳ ලැබිය යුතු දෑ	8 100	-
වෙළඳ ගෙවිය යුතු දෑ	-	3 740
වෙනත් ආදායම්	-	2 700
වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය (2022.04.01)	-	460
ආදායම් බදු ප්‍රතිපාදන (2022.04.01)	-	750
ගෙවූ ආදායම් බදු	1 890	-
පරිපාලන වියදම්	3 640	-
බෙදාහැරීමේ වියදම්	2 800	-
වෙනත් වියදම්	1 480	-
මූල්‍ය වියදම්	1 825	-
මුදල් හා මුදල් සමාන දෑ	3 900	-
ප්‍රකාශිත ප්‍රාග්ධනය (20/- සා.කොා.)	-	40 000
ප්‍රත්‍යාගණන සංචිතය - ගොඩනැඟිලි	-	5 000
පොදු සංචිතය	-	5 000
රඳවාගත් ඉපයුම් (2022.04.01)	-	3 350
12% බැංකු ණය	-	2 000
ගෙවූ බැංකු ණය පොළී	200	-
	132 000	**132 000**

[දෙවන පිටුව බලන්න.]

අතිරේක තොරතුරු :

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත දැ සැලකිල්ලට ගත යුතුය.

(i) 2023.03.31 දිනට ව්‍යාපාරයේ අවසන් තොගය පහත පරිදි ගණනය කර ඇත.

	රු.'000
පිරිවැය	3 815

ශුද්ධ උපලබ්ධි අගය පදනම් කරගෙන විකුණුම් පිරිවැය ගණනය කර ඇති අතර, තොග සම්බන්ධව වෙනත් කිසිදු ගැලපීමක් සිදුකර නැත.

(ii) 2023 මාර්තු 18 දින ගනුදෙනුකරුවෙකු සමඟ ඇති කරගත් එකඟතාවයක් මත ලැබී ඇති රු. 350 000 ක් වූ 100% ක අත්තිකාරම් මුදල වෙනත් ආදායම් තුළ අන්තර්ගත වේ. මෙම අත්තිකාරමට අදාළ භාණ්ඩ තොගය 2023.05.02 දින ගනුදෙනුකරුට භාරදී ඇත.

(iii) සමාගම වසරක වගකීම් සහතිකයක් යටතේ භාණ්ඩ විකිණීම සිදු කරන අතර, 2022.04.01 දිනට පවතින ප්‍රතිපාදනය වෙනුවෙන් 2022/2023 වර්ෂය තුළදී රු. 280 000 ක් ගෙවා ඇති අතර, එය වෙනත් වියදම් තුළ අන්තර්ගත වේ. 2023.03.31 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය රු. 635 000 ක් විය යුතු බව විශ්වාසනීය ලෙස ඇස්තමේන්තුකර ඇත.

(iv) * ශේෂ පිරික්සුමේ දක්වෙන්නේ දේපළ, පිරියත හා උපකරණවල 2022.04.01 දිනට ධාරණ අගයයි. එහි සංයුතිය පහත වේ. (සංඛ්‍යා රු.'000 වලිනි.)

අයිතමය	පිරිවැය	ධාරණ
ඉඩම්	32 000	32 000
ගොඩනැගිලි	28 000	12 800
මෝටර් රථ	15 000	9 000
කාර්යාල උපකරණ	15 000	13 750
	90 000	**67 550**

* දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමයට පහත පරිදි වාර්ෂිකව ක්ෂය කෙරේ.

ගොඩනැගිලි	10%
මෝටර් රථ	20%
කාර්යාල උපකරණ	5%

(v) 2022.10.01 දින සමාගම සතු පැරණි මෝටර් රථයක් පැවරීමෙන් හා මුදලින් රු. 1 200 000 ක් ගෙවා නව මෝටර් රථයක් අත්පත් කර ගන්නා ලදී. මුදලින් ගෙවන ලද වටිනාකම හුවමාරු කළ නව රථයේ වටිනාකමෙන් 25% ක් නියෝජනය කරයි. පැවරූ දිනට පැරණි රථයේ ධාරණ වටිනාකම රු. 2 280 000 ක් වූ අතර, එදිනට එහි සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු. 1 520 000 කි. මුදලින් ගෙවන ලද වටිනාකම මුදල් ගිණුමට බැර කොට බෙදාහැරීමේ වියදම් ගිණුමට හර කොට ඇත. ඒ හැර මෙම හුවමාරුවට අදාළ කිසිදු සටහනක් පොත්වල තබා නැත.

(vi) * 2022.04.01 දින ඉඩම් ප්‍රථමවරට ප්‍රත්‍යාගණනය කරන ලද අතර, 2023.03.31 දින ගොඩනැගිලි හා කාර්යාල උපකරණ ද ප්‍රත්‍යාගණනය කර ඇත. ප්‍රත්‍යාගණිත අගයන් පහත වේ.

	රු.'000
ඉඩම්	40 000
ගොඩනැගිලි	8 000
කාර්යාල උපකරණ	12 500

* 2020.03.31 දින සිදුකර ඇති කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණනයේ දී රු. 300 000 ක අලාභයක් හඳුනාගෙන ලාභයෙන් කපා හැර ඇත. මේ වර්ෂය තුළ සිදුකළ ප්‍රත්‍යාගණනයන් ට අදාළව කිසිදු සටහනක් වාර්තා කර නැත.

(vii) ගෙවූ ආදායම් බදු ශේෂය තුළ අඩංගු 2021/2022 වර්ෂයට අදාළ බදු ප්‍රමාණය රු. 850 000 කි. 2022/2023 වර්ෂයේ අවසාන කාර්තුව සඳහා ඇස්තමේන්තුගත බදු වගකීම රු. 960 000 කි.

(viii) විගණන ගාස්තු රු. 420 000 ක් සහ අධ්‍යක්ෂ සංවේතන රු. 1 260 000 ක් පරිපාලන වියදම්වල ඇතුළත් වන අතර, ගෙවූ අතුරු ලාභාංශ රු. 525 000 ක් මූල්‍ය වියදම් තුළ අන්තර්ගත වේ.

(ix) සමාගම 2022.04.01 දින කල්බදු සමාගමක් සමඟ ඇතිකරගත් ගිවිසුමක් යටතේ යන්ත්‍රයක භාවිත අයිතිය ලබාගත් අතර, පහත තොරතුරු ඊට අදාළ වේ.

- කල්බදු කාලය වර්ෂ 05
- මූලික ගෙවීම රු. 500 000
- වාර්ෂික කල්බදු වාරිකය රු. 1 640 000
- යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වර්ෂ 08 ක් වන අතර, කල්බදු කාලය අවසානයේ දී යන්ත්‍රයේ අයිතිය සුමුදු සමාගමට හිමි වේ.

* සමාගම විසින් මූලිකව මිනුම් කරන ලද කල්බදු වගකීමේ මූලික වටිනාකම රු. 5 500 000 කි. පළමු වර්ෂ දෙකට අදාළ පොළිය පහත වේ.

	රු.'000
2022/2023 වසර	824
2023/2024 වසර	700

* මූලික ගෙවීම හා කල්බදු වගකීම හඳුනාගැනීමට අදාළ ගිණුම් තැබීම නිවැරදිව සිදුකර ඇති අතර, 2023.03.31 දින ගෙවන ලද පළමු වාරික මුදල වෙළඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුමට හර කොට ඇත.

(x) වෙළඳ ලැබිය යුතු දෑ ශේෂයෙන් දක්වා ඇත්තේ වසර අග ශේෂය මත 10% ක හානිකරණ අලාභ සඳහා ඉඩහැරීමක් සිදු කිරීමට 2023.03.31 දින ගත් තීරණය මත අදාළ ගැලපීම් සිදු කළ පසු වෙළඳ ලැබිය යුතු දෑ ධාරණ අගය යි. මෙහිදී හඳුනාගත් වියදම වෙනත් වියදම්වල ඇතුළත් කර ඇත.

(xi) අධ්‍යක්ෂක මණ්ඩල තීරණ.

- පොදු සංචිතයට රු. 1 500 000 ක් මාරු කිරීම.
- සාමාන්‍ය කොටස් හිමියන් ට කොටසකට රු.5 ක අවසාන ලාභාංශගහක් ගෙවීම.

අවශ්‍ය වන්නේ:

LKAS -1 **"මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම"** ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සුමුදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන. (සටහන් සමඟ)

(1) 2023.03.31 දිනෙන් අවසන් වසර සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය.

(2) 2023.03.31 දිනෙන් අවසන් වසර සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය.

(3) 2023.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

(මුළු ලකුණු 40 යි.)

2. (අ) පුණ්‍යජා විසින් පවත්වාගෙන් යන කුඩා ඇඟලුම් කම්හලේ නිෂ්පාදන සේවිකාවන් දෙදෙනෙක් සහ එක් වැඩ සුපරීක්ෂකවරියක් සේවය කරයි. ඔවුන්ගේ 2023 ජූලි මාසයේ වැටුප් ගණනය කිරීමට අදාළව පහත තොරතුරු ඔබට සපයා ඇත.

(i) නිෂ්පාදන සේවිකාවන් සඳහා රු. 80 000 ක මාසික මූලික වැටුපක් ගෙවන අතර, වැඩ සුපරීක්ෂකවරියගේ මාසික මූලික වැටුප රු. 100 000 කි.

(ii) නිෂ්පාදන සේවිකාවන් සඳහා ඔවුන්ගේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය මත ගණනය කරනු ලබන යම් ප්‍රතිශතයක් නිෂ්පාදන දිරි දීමනාවක් ලෙස ගෙවන අතර, එය මූලික වැටුප මත පදනම්ව ගණනය කෙරේ. 2023 ජූලි මාසය සඳහා එසේ ගණනය කරන ලද නිෂ්පාදන දිරි දීමනා ප්‍රතිශතය පහත වේ.

දිලිනි	18.75%
තුෂාර	25%

(iii) 2023 ජූලි මාසය සඳහා එක් එක් සේවිකාවගේ අතිකාල දීමනා ඉපයීම පහත වේ.

සේවිකාව	**තනතුර**	**අතිකාල දීමනා රු.**	
		සතියේ දින	**සති අන්ත දින**
දිලිනි	නිෂ්පාදන සේවිකා	9 500	2 500
තුෂාරා	නිෂ්පාදන සේවිකා	11 200	6 800
සචිනි	වැඩ සුපරීක්ෂක	18 000	12 000

(iv) නිෂ්පාදන සේවිකාවන් සහ වැඩ සුපරීක්ෂකවරිය 2023 ජූනි සහ ජූලි මාසවල වැටුප් අත්තිකාරම් ලෙස පහත පරිදි මුදල් ලබා ගෙන ඇති බව වැටුප් අත්තිකාරම් ලේඛන පරීක්ෂා කිරීමේ දී අනාවරණය විය.

	ජූනි රු.	**ජූලි රු.**
දිලිනි	16 000	12 000
තුෂාරා	24 000	20 000
සචිනි	10 000	16 000

* වැටුප් අත්තිකාරම් සෑම මසකම 20 වන දින ගෙවන අතර, එය ඊළඟ මාසයේ වැටුපෙන් අඩු කරගනු ලබයි.

(v) රජයේ බදු නීතිය අනුව සේවකයන්ගේ දළ වැටුප රු. 100 000 ක් ඉක්මන විට දී එම සීමාව ඉක්මවා උපයන වැටුපෙන් 20% ක බද්දක් ගෙවිය යුතුය. ආයතනය මෙම උපයන විට ගෙවිය යුතු බද්ද සෑම මාසයක ම ගණනය කර සේවක වැටුපෙන් අඩු කර ශුද්ධ වැටුප සේවකයා ට ගෙවිය යුතු වේ.

(vi) සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකදායකය මූලික වැටුපෙන් 10% ක් වන අතර, සේවා යෝජක දායකය මූලික වැටුපෙන් 15% කි. තවද සේවක භාරකාර අරමුදල සඳහා සේවා යෝජක දායක මූලික වැටුපෙන් 3% කි.

(vii) සේවක වැටුප් හා සම්බන්ධ සියලු ගෙවීම් අදාළ මාසයට පසු මාසයේ 10 වන දින ගෙවීම් කිරීම ආයතනයේ භාවිතයයි.

අවශ්‍ය වන්නේ,

(1) 2023 ජූලි මාසය සඳහා වැටුප් ලේඛනය.

(2) වැටුප් හා චේතන ගිණුම හා වැටුප් හා චේතන පාලන ගිණුම.

(3) වැටුප් අත්තිකාරම් ගිණුම.

(4) 2023 ජූලි මාසයේ සේවකයන් හා සම්බන්ධ මුළු වැටුප් වියදම ගණනය කරන්න.

(ලකුණු 16 යි.)

2 (ආ) සීමිත අශේන් පොදු සමාගම සතුව **''සැකසුම්''** හා **''නිමවුම්''** නම් වූ නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන 02 කින් යුතු නිෂ්පාදනාගාරයක් සහ වෙනම ම පරිශ්‍රයක පිහිටා ඇති ගබඩාවක් ද ඇත. සමාගම විසින් ''P'' හා ''Q'' නම් වූ භාණ්ඩ වර්ග 02 ක් නිපදවන අතර, ඔවුන්ගේ ඉදිරි ගිණුම් වර්ෂය සඳහා පහත සඳහන් ඇස්තමේන්තුගත පොදුකාර්ය පිරිවැය තොරතුරු ඉදිරිපත් කර ඇත.

			රු.'000
වක්‍ර අමුද්‍රව්‍ය	-	සැකසුම්	420
	-	නිමවුම්	210
වක්‍ර වැටුප්	-	සැකසුම්	480
	-	නිමවුම්	520
	-	ගබඩාව	400
ගබඩා කුලී			240
විදුලිය	-	කම්හල	840
	-	ගබඩාව	150
යන්ත්‍ර ක්ෂය			300
ආරක්ෂක වියදම්			490
සේවක සුභසාධන වියදම්			750

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(i) පිරිවැය මධ්‍යස්ථානවලට අදාළ තොරතුරු.

	සැකසුම්	**නිමවුම්**	**ගබඩාව**
යන්ත්‍ර පිරිවැය (රු.'000)	1 800	1 200	-
කිලෝවොට් පැය	240	180	80
ආරක්ෂක මුරකරුවන් ගණන	8	8	12
මුළු සේවක සංඛ්‍යාව	75	50	25
ගබඩා අධියාචනා පත් සංඛ්‍යාව	60	48	-

(ii) සැකසුම් අංශයේ පොදුකාර්ය පිරිවැය යන්ත්‍ර පැය පදනමට ද, නිමවුම් අංශයේ පොදුකාර්ය පිරිවැය ශ්‍රම පැය පදනමට ද භාණ්ඩවලට අන්තර්ග්‍රහණය කරනු ලබයි.

[පස් වන පිටුව බලන්න.]

(iii) වර්ෂයක් තුළ P හා Q භාණ්ඩ දෙක සඳහා සෘජු පිරිවැය පහත පරිදි ගණනය කර ඇත.

	P භාණ්ඩය	Q භාණ්ඩය
සෘජු අමුද්‍රව්‍ය (ඒකකයකට රු.)	420	225
සෘජු ශ්‍රමය (ඒකකයකට රු.)	300	65
වෙනත් සෘජු පිරිවැය (ඒකකයකට රු.)	140	50

(සv) සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ 02 සඳහා පහත තොරතුරු අදාළ වේ.

විස්තරය	P		Q	
	සතය	අයවැයගත	සතය	අයවැයගත
සැකසුම් අංශය තුළ යන්ත්‍ර පැය	3	4	2	3
නිමවුම් අංශය තුළ ශ්‍රම පැය	4	5	3	3
නිෂ්පාදනය කළ ඒකක ප්‍රමාණය	3 000		5 000	

(v) P භාණ්ඩය ඒකකයක විකුණුම් මිල මත 20% ක ලාභාන්තිකයක් තබා විකුණුම් මිල තීරණය කරන අතර, Q භාණ්ඩයේ විකුණුම් මිල තීරණය කරනුයේ පිරිවැයට 20% ක ලාභාන්තිකයක් තබා ගනිමිනි.

අවශ්‍ය වන්නේ,

(1) පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (ගබඩාවේ පොදුකාර්ය පිරිවැය නැවත විභජනය ද ඇතුළත්ව)

(2) සැකසුම් හා නිමවුම් යන පිරිවැය මධ්‍යස්ථාන සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත.

(3) P හා Q භාණ්ඩ වර්ග දෙක සඳහා ඒකකයක නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය වෙන වෙනම ගණනය කරන්න.

(4) P භාණ්ඩයේ ඒකකයක විකුණුම් මිල හා Q භාණ්ඩයේ ඒකකයක ලාභාන්තිකය ගණනය කරන්න.

(5) P භාණ්ඩයෙන් ඒකක 250 ක් ද Q භාණ්ඩයෙන් ඒකක 300 ක් ද විකුණන ලද්දේ නම් ඉපයූ මුළු දළ ලාභය කොපමණ ද?

(ලකුණු 24 යි.)

(මුළු ලකුණු 40 යි.)

3. සුසර ව්‍යාපාරය ලී බඩු අලෙවි ව්‍යාපාරයකි. 2023.08.01 දිනට පැවති වත්කම් හා වගකීම් පහත දැක්වේ.

	රු.'000
දේපළ, පිරියත හා උපකරණ (ඉඩම් රු. 1 000 000)	1 600
තොගය	500
වෙළඳ ලැබිය යුතු දෑ	1 000
වෙළඳ ලැබිය යුතු දෑ සඳහා ඉඩ හැරීම	100
වෙනත් ලැබිය යුතු දෑ - සැපයුම්කරුට ගෙවූ අත්තිකාරම්	100
- ඉදිරියට කළ ගෙවල් කුලී	200
මුදල්	800
12% බැංකු ණය	1 000
වෙළඳ ගෙවිය යුතු දෑ	700
නොඉපයූ ආදායම්	300

2023 වර්ෂයේ අගෝස්තු මාසයේ සිදුවූ ගනුදෙනු පහත සඳහන් වේ.

(i) පිරිවැය රු. 2 000 000 ලී බඩු මිලදී ගත් අතර, මෙයින් රු. 700 000 මුදල් ගෙවන ලදී.

(ii) පිරිවැය රු. 1 500 000 වූ ලී බඩු රු. 2 500 000 විකුණූ අතර, මෙයින් රු. 1 500 000 ලැබීමට ඇත.

(iii) පිරිවැය රු. 100 000 වූ ලී බඩු තොගය ඇණවුමට වෙනස් වූ නිසා සැපයුම්කරුට ආපසු යැවීම.

(iv) රු. 150 000 වෙළඳ ලැබිය යුතු දෑ ශේෂ වෙළඳ ගෙවිය යුතු දෑ ශේෂයට හිලව් කිරීම.

(v) වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය සඳහා මුදල් ලැබීම රු. 1 080 000. දුන් වට්ටම් 10%.

(vi) සැපයුම්කරුවන්ට ගෙවූ අත්තිකාරම් වෙනුවෙන් ලී බඩු මිලදී ගැනීම රු. 400 000.

(vii) වෙළඳ ගෙවිය යුතු දෑ ශේෂය රු. 1 100 000 පියවීමේ දී ලද වට්ටම රු. 100 000.

(viii) ගෙවූ ගෙවල් කුලී රු. 300 000 වන අතර, මෙයින් රු. 100 000 ක් 2023 සැප්තැම්බර් මාසයට අදාළ වේ.

[හය වන පිටුව බලන්න.]

(ix) නොඉපයූ ආදායම් සඳහා ලී බඩු තොගය සැපයීම රු. 600 000 වන අතර, මෙම ලී බඩු තොගයෙහි පිරිවැය රු. 400 000 ක් වේ. හිඟ මුදල් ශේෂය මුදලින් ලැබිණි.

(x) ගනුදෙනුකරුවෙකු විසින් හානිවූ ලී බඩු ව්‍යාපාර විසින් සැපයීම නිසා ආපසු එවුම් රු. 300 000 විකුණුම් මිල 1/3% ලාභයක් එකතු කර විකුණුම් මිල තීරණය කර ඇත. 33

(xi) 2023.08.31 දිනෙන් අවසාන මාසය සඳහා බැංකු වාරිකය සුසර විසින් ගෙවීම රු. 150 000.

(xii) සුසරගේ දියණියගේ මංගල උත්සවයේ වියදම් සඳහා ඉවත්කර ගැනීම් රු. 100 000.

(xiii) දේපළ පිරියත හා උපකරණ වාර්ෂික ක්ෂය 20%.

(xiv) 2023 ඔක්තොම්බර් මාසයේ දී ලී බඩු තොගයක් සැපයීමට ගනුදෙනුකරුවෙකුගෙන් ලද මුදල රු. 400 000.

<u>ගැළපීම් :</u>

- වෙළඳලැබිය යුතු දෑ හානිකරණ අලාභ කපා හැරීම් රු.100 000 වන අතර, ඉතිරි ශේෂයෙන් 10% වෙළඳ ලැබිය යුතු හානිකරණ අලාභ ලෙස ඉඩ හැරිය යුතුය.

අවශ්‍ය වන්නේ,

1. 2023.08.01 ආරම්භක ශේෂ සහිතව ගනුදෙනු අංක (i) සිට (xiv) දක්වා ගනුදෙනුවල ද්විත්ව බලපෑම් පහත ගිණුම්කරණ සමීකරණයට ඇතුළත් කර දැක්වීම.

අංකය	වත්කම්					වගකීම්			හිමිකම්
	දේ. පි. උ.	තොග	වෙළඳ ලැබිය යුතු දෑ	වෙනත් ලැබිය යුතු දෑ	මුදල්	වෙළඳ ගෙවිය යුතුදෑ	වෙනත් ගෙවිය යුතු දෑ	බැංකු ණය	
ශේෂ (i) (ii) (iii)									
එකතුව									

2. 2023 අගෝස්තු මාසය සඳහා
   (i) මුළු අය භාරය
   (ii) මුළු ආදායම
   (iii) මුළු වියදම
   (iv) ලාභය හෝ අලාභය

3. 2023.08.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත සඳහන් ලෙජර් ගිණුම්
   (i) වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම
   (ii) වෙළඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුම
   (iii) වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීමේ ගිණුම
   (iv) වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ අලාභ ගිණුම

(ලකුණු 40 යි.)

4 (අ) සීමාසහිත සම්පත් සමාගම VAT සඳහා ලියාපදිංචි වූ ව්‍යාපාරයකි. 2023.08.01 දිනට පැවැති වත්කම්, වගකීම් සහ හිමිකම් පහත දැක්වේ.

	රු.'000
ඉඩම් හා ගොඩනැගිලි	2 000
ආරම්භක තොගය	500
වෙළඳ ලැබිය යුතු දෑ- ජගත්	300
- සුසන්න	200
මුදල්	800
බැංකු ණය	1 000
වෙළඳ ගෙවිය යුතු දෑ - අරුණ	200
- අනුර	100
ගෙවිය යුතු VAT	150

2023 අගෝස්තු මාසය සඳහා වූ ගනුදෙනු හා සිද්ධි පහත දැක්වේ.

දිනය	ගනුදෙනු	වෙනත් කරුණු
08.01	ජගත්ගෙන් ලැබිය යුතු මුදල් 10% වට්ටමකට යටත්ව මුදල් ලැබීම.	08.02 දින උපලබ්ධි විය.
08.03	අරුණට ගෙවිය යුතු මුදල් 5% වට්ටමකට යටත්ව මුදල් ගෙවීම.	08.04 දින බැංකුවට ඉදිරිපත් විය.
08.05	අත්පිට ගැනුම් VAT සහිතව රු. 2 280 000	08.07 දින බැංකුවට ඉදිරිපත් විය.
08.10	අත්පිට විකුණුම් VAT රහිතව රු. 3 000 000	08.12 දින උපලබ්ධි විය.
08.12	අරුණගෙන් භාණ්ඩ ණයට ගැනුම් VAT රහිතව රු. 1 000 000	08.15 ගැනුම් වට්නාකමෙන් 10% වූ භාණ්ඩ ආපසු යැවුම්
08.15	ජගත් ට භාණ්ඩ ණයට විකිණීම VAT සහිත රු. 1 710 000	08.16 විකුණුම් වට්නාකමෙන් 10% වූ භාණ්ඩ ආපසු එවුම්
08.16	ලකුණු කළ මිල රු.1 000 000 වූ භාණ්ඩ අනුරගෙන් ණයට ගැනුම් VAT සහිත රු. 912 000	-
08.20	සුසන්තට ලකුණු කළ මිල රු.1 200 000 වූ ණයට විකුණුම් VAT රහිත රු. 900 000	-
08.21	සුසන්තගෙන් මුදල් ලැබීම් රු. 700 000 දුන් වට්ටම් රු. 100 000	09.01 අගරු විය.
08.22	අනුරට මුදල් ගෙවීම රු. 540 000 ලද වට්ටම් 10%	09.02 බැංකුවට ඉදිරිපත් විය.
08.23	රක්ෂණ වියදම් දැරීම. රු.80 000	08.24 බැංකුවට ඉදිරිපත් විය.
08.24	ලද ගෙවල් කුලී රු. 180 000	08.25 දින උපලබ්ධි විය.
08.26	කොටස් නිකුත් කිරීමෙන් ලද මුදල් රු. 2 000 000	08.26 දින උපලබ්ධි විය.
08.27	ස්ථාවර නියෝග මත වරිපනම් බැංකුව විසින් ගෙවීම රු. 70 000	-
08.31	ලාභාංශ ප්‍රේෂණ රු. 260 000	-

අමතර තොරතුරු :

(i) එකතු කළ අගය මත බදු (VAT) අනුපාතය 14% කි.

(ii) 2023.08.01 දින මුදල් පාලන ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය සමාන විය.

අවශ්‍ය වන්නේ,

(1) පහත සඳහන් මූලික සටහන් පොත්.

- මුදල් ලැබීම් ජ'නලය
- මුදල් ගෙවීම් ජ'නලය
- ගැනුම් ජ'නලය
- විකුණුම් ජ'නලය

(2) පහත සඳහන් ලෙජර් ගිණුම්.

- සංශෝධනය කිරීමට පෙර මුදල් පාලන ගිණුම
- VAT පාලන ගිණුම
- සංශෝධිත මුදල් පාලන ගිණුම

[අට වන පිටුව බලන්න.

(3) 2023.08.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය

(4) පහත සඳහන් උප ලෙජර
- වෙළඳ ලැබිය යුතු දෑ ලෙජරයේ ගිණුම්
- වෙළඳ ගෙවිය යුතු දෑ ලෙජරයේ ගිණුම්

(ලකුණු 30 යි.)

4. (ආ) සීමාසහිත යසෝදා සමාගම 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

ශුද්ධ ලාභය	රු. 1 000 000
දළ ලාභ අනුපාතය	40%
ශුද්ධ ලාභ අනුපාතය	20%
තොග පිරිවැටුම් අනුපාතය	වාර 05
ණය හිමිකම් අනුපාතය	0.25
ණය පොළී අනුපාතය	10%
ආදායම් බදු - බදු පෙර ලාභයෙන්	50%
2023.03.31 දිනට බැංකු ණය	රු. 2 500 000
2022.04.01 දිනට තොගය	රු. 400 000
සාමාන්‍ය කොටසක (ප්‍රතිෂ්ඨාව රු.50/-)	රු. 8 000 000

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී බැංකු ණය ගෙවීම් සිදුකර නොමැත.

අවශ්‍ය වන්නේ,

(1) විකුණුම් වටිනාකම
(2) 2023.03.31 දිනට අවසාන තොගය
(3) හිමිකම් ප්‍රතිලාභ අනුපාතය
(4) පොළී ආවරණ අනුපාතය
(5) කොටසක ඉපයුම්

(ලකුණු 10 යි.)

(මුළු ලකුණු 40 යි.)

5. (අ) තමාරා සහ සනාරා විසින් පවත්වාගන යන හවුල් ව්‍යාපාරයේ 2023.03.31 දිනෙන් අවසන් වසර සඳහා පිළියෙල කරන ලද ආදායම් ප්‍රකාශනය පහත වේ.

		රු.'000
විකුණුම්	-	25 600
විකුණුම් පිරිවැය	-	(9 600)
දළ ලාභය		16 000
වෙනත් ආදායම්		160
		16 160
බෙදා හැරීමේ වියදම්	3 770	-
පරිපාලන වියදම්	8 450	-
වෙනත් වියදම්	120	-
මූල්‍ය වියදම්	330	(12 670)
ශුද්ධ ලාභය		**3 490**

ඉහත ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී පහත සඳහන් කරුණු සැලකිල්ලට **ගෙන නැති බව** පසුව අනාවරණය වී ඇත.

(i) 2023 මාර්තු මාසයේ ආපසු එවුම් ජ'නලයේ නිවැරදි එකතුව වූ රු.360 000 ක් වොළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමට නිවැරදිව සටහන් කර විකුණුම් ගිණුමට බැරකොට ඇත.

(ii) 2023.3.31 දිනට ලැබිය යුතු ආයෝජන ආදායම් රු.30 000 කි. වර්ෂය තුළ ලද ආයෝජන ආදායම් රු. 40 000 ක් වෙනත් ආදායම් තුළ අන්තර්ගත වේ.

(iii) 2022.04.01 දිනට වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ සඳහා ඉඩහැරීමේ ගිණුමේ ශේෂය රු. 760 000 ක් වූ අතර, 2023.03.31 දිනට හානිකරණ වූ අලාභ සඳහා ඉඩහැරීම් අඩුකළ පසු වෙළඳ ලැබිය යුතු දෑවල ධාරණ අගය රු. 7 200 000 කි. වසර අග ශේෂය මත 10% ක් හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම ආයතනයේ ක්‍රමවේදයයි.

(iv) 2023.03.31 දිනට ව්‍යාපාරයේ පැවති භෞතික තොගයේ පිරිවැය රු. 1 720 000 ක් වුවද, එදිනට තක්සේරු කරන ලද එහි ශුද්ධ උපලබ්ධි වටිනාකම රු. 1 600 000 කි.

(v) 2023.03.31 දිනට උපචිත ප්‍රචාරණ ගාස්තු රු.60 000 ක් වන අතර, උපචිත විදුලි ගාස්තුව රු. 180 000 කි.

(vi) සනාරා විසින් ව්‍යාපාරයට රු.400 000 ක ණය මුදලක් සපයා ඇති අතර, 2022.10.01 දින එදිනට පොළියත් සමඟ ණය මුදල 50% ක් ගෙවා ඇති අතර, ඒ පිළිබඳ කිසිදු ගැලපීමක් සිදුකර නොමැත. .

අතිරේක තොරතුරු:

අ. තමාරා සහ සනාරාගේ හවුල් ගිවිසුමේ කොන්දේසි පහත වේ.

- ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත ගෙවන වාර්ෂික පොළිය 5%.
- තමාරාට රු. 20 000 ක මාසික වේතනයක් හිමිවේ.
- ප්‍රාග්ධනයට අමතරව සපයන ණය සඳහා ගෙවන වාර්ෂික පොළිය 15% කි.
- තමාරා සහ සනාරා පිළිවෙලින් 3 : 2 අනුපාතයට ලාභාලාභ බෙදාගනී.

ආ. 2023.03.31 දින සනාරා හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, එදිනම තමාරා සමඟ එක්ව ව්‍යාපාරය පවත්වාගන යාමට ඉෂාරා බඳවා ගන්නා ලදී. මෙදින පහත එකඟතාවයන් ඇති වූ අතර, ඒවා පිළිබඳව කිසිදු ගැලපීමක් පොත්වල සටහන් තබා නැත.

- ඉෂාරා රු. 4 400 000 ක් ප්‍රාග්ධනය ලෙස යෙදවූ අතර, ඉන් රු. 2 500 000 ක් එදිනම සනාරා ට ගෙවීම.
- කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම මඟින් ගැලපීම් කළයුතු අතර, එදිනට කීර්තිනාමයේ තක්සේරු වටිනාකම රු. 1 500 000 කි.
- සනාරාගේ ඉතිරි හිමිකම ඇයගේ ණය ගිණුමට මාරු කිරීම.
- තමාරා සහ ඉෂාරා ඉදිරියට ලාභාලාභ සමානව බුක්ති විඳීම.

ඉ. 2022.03.31 දිනට හවුල්කරුවන්ගේ මුළු හිමිකම සහ ජංගම ගිණුම්වල ශේෂයන් පහත වේ.

	තමාරා (රු.'000)	**සනාරා (රු.'000**
මුළු වටිනාකම	10 430	9 500
ජංගම ගිණුම් ශේෂය (බැර)	430	1 500

අවශ්‍ය වන්නේ,

(1) අදාළ සංශෝධනයන්ට පසු සංඛ්‍යා ඇතුළත් කරමින්2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංශෝධිත ආදායම් ප්‍රකාශනය.

(2) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ විසර්ජන ගිණුම.

(3) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්.

(ලකුණු 20 යි.)

5. (ආ) සීමිත මොහොමඩ් පොදු සමාගමේ 2023.03.31 දිනට සහ 2022.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

		රු.'000
	2023.03.31	**2022.03.31**
දේපළ, පිරියත හා උපකරණ පිරිවැය	11 000	12 100
සමුච්චිත ක්ෂය වෙන්කිරීම	5 000	5 400
වෙළඳ ලැබිය යුතු දෑ	1 300	1 000
වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම	130	100
අවසාන තොගය	1 100	1 500
මුදල් හා මුදල් සමාන දෑ	6 230	2 000
පොදු සංචිත	2 000	1 400
රඳවාගත් ඉපයුම්	1 000	450
වෙළඳ ගෙවිය යුතු දෑ	800	1 200
බැංකු ණය	2 050	2 000
ආදායම් බදු වෙන්කිරීම	400	300

අතිරේක තොරතුරු :

(i) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ගොඩනැඟිල්ල ප්‍රථම වරට ප්‍රත්‍යාගණන ඌනතාවය රු. 500 000 වන අතර, එම ගොඩනැඟිල්ලේ පිරිවැය හා ධාරණ අගය පිළිවෙලින් රු. 2 000 000 හා රු. 1 200 000 යි.

(ii) 2023.03.31 දිනට පිරිවැය රු. 1 500 000 වූ මෝටර් රථයක් විකිණීමෙන් ලද ලාභය රු. 300 000 වන අතර, මෙම මෝටර් රථය 2020.03.31 දිනට මිලදී ගෙන ඇත. මෝටර් රථ සරල මාර්ග ක්‍ෂය ක්‍රමයට 10% බැගින් ක්‍ෂය කරනු ලැබේ.

(iii) 2022.06.30 දින ලී බඩු මිලදී ගෙන ඇත.

(iv) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ රු.20/- සාමාන්‍ය කොටස් 100 000 ක් නිකුත් කරන ලද අතර, අයඳුම්පත් 150 000 ලැබීම. වැඩිපුර ලද අයඳුම්පත් ප්‍රතික්ෂේප කරන ලදී. තවද, රු.25/- සාමාන්‍ය කොටස් 20 000 රඳවාගත් ඉපැයුම් භාවිත කරමින් සංචිත ප්‍රාග්ධනිත කර ඇත.

(v) වර්ෂය තුළ අතුරු ලාභාංශ ගෙවීම රු. 350 000 වන අතර, යෝජිත ලාභාංශ රු. 500 000.

(vi) වර්ෂය තුළ ගෙවූ ආදායම් බදු රු.600 000.

(vii) වර්ෂය තුළ ගෙවූ බැංකු ණය වාරිකය රු. 800 000 වන අතර, මෙහි ඇතුළත් ණය පොළිය රු. 250 000 කි.

අවශ්‍ය වන්නේ,

LKAS - 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශ ප්‍රමිතියට අනුව 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත මොහොමඩ් පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.

(ලකුණු 20 යි.)

6. (අ) ලක්විරු ප්‍රජා සංවර්ධන පදනම ජාතික නිදහස් දිනයට සමගාමීව **''නිදහස් ගී''** නමින් සංගීත වැඩසටහනක් සංවිධානය කිරීමට පහත ඇස්තමේන්තු සකස් කර ඇත.

	රු.'000
ශාලා කුලිය	120 000
සංගීත කණ්ඩායමේ අය කිරීම	180 000
ප්‍රචාරණ වියදම	75 000
සැරසිලි සහ ආලෝකකරණය	125 000
ඩිජිටල් බැනර් මුද්‍රණ වියදම	20 000
ප්‍රවේශ පත්‍ර මුද්‍රණ වියදම	5 000
සංවිධානය කිරීමේ වියදම්	15 000
අනෙකුත් ස්ථාවර වියදම්	60 000

අනෙකුත් තොරතුරු:

1. ශාලා කුලිය සම්පූර්ණයෙන් ගෙවීමට අනුග්‍රාහක සමාගමක් කැමැත්ත පළකර ඇති අතර, ගායක ගායිකාවන් 5 දෙනෙකු නොමිලයේ ප්‍රසංගයට දායක වීමට එකඟ වී ඇත.
2. ටිකට් පතක විකුණුම් මිල රු. 2 000 ක් වන අතර, සෑම ප්‍රේක්ෂකයෙකුට ම සමරු පොතක් පිරිනමන අතර, එක් පොතක පිරිවැය රු. 540 කි.
3. සහභාගීවන සෑම අයෙකුට ම ජාතික වීරයන්ගේ ඡායාරූප ඇතුළත් සිහිවටනයක් ද පිරිනැමෙන අතර, එක් සිහිවටනයක පිරිවැය රු. 260 කි.
4. ශාලාවේ උපරිම ආසන ධාරිතාවය 650 කි.
5. උත්සවය සඳහා ආරාධිත අමුත්තන් 75 කට ආරාධනා කෙරෙන අතර, ඔවුන්ගෙන් කිසිදු මුදලක් අය නොකෙරේ. නමුත් සමරු පොත සහ සිහිවටනය සෑම ආරාධිතයකුට ම ලබා දිය යුතු වේ.

අවශ්‍ය වන්නේ,

(1) ප්‍රවේශ පත්‍ර අලෙවි ආදායමෙන් ආවරණය කර ගැනීමට අපේක්ෂිත මුළු ස්ථාවර පිරිවැය කොපමණ ද?

(2) එක් ප්‍රේක්ෂකයකුට අදාළ දායකය කීයද?

(3) මුළු පිරිවැය ආවරණය කරගැනීම සඳහා අලෙවි කරගත යුතු ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව (සහභාගි විය යුතු ප්‍රේක්ෂක සංඛ්‍යාව) කොපමණ ද?

(4) ප්‍රවේශ පත්‍ර ආදායමෙන් ලැබෙන අතිරික්තයෙන් රණවිරු සුභ සාධනය සඳහා මුදලක් පරිත්‍යාග කිරීමට අපේක්ෂා කරන්නේ නම් ප්‍රවේශ පත්‍ර 510 ක් අලෙවි වේ නම් පරිත්‍යාග කළහැකි මුදල කොපමණ ද?

(5) ශාලාවේ උපරිම ධාරිතාවය ප්‍රයෝජනයට ගනිමින් උපයාගත හැකි අතිරික්තය කොපමණ ද? (සියලු ආරාධිත අමුත්තන් සහභාගී වේ යැයි උපකල්පනය කරන්න.)

(ලකුණු 15 යි.)

[එකොළොස් වන පිටුව බලන්න.]

6. (ආ) සීමිත පුෂ්ප පොදු සමාගම මුද්‍රාණලයක් පවත්වා ගෙන යන අතර, පවතින මුද්‍රණ යන්ත්‍රය විකුණා නව තාක්ෂණික මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමට සලකා බලමින් සිටී. එයට අදාළ තොරතුරු පහතින් දැක්වේ.

(i) නව යන්ත්‍රයේ ගැනුම් මිල රු. 2 000 000 වන අතර, ගෙන ඒමේ කුලී සහ සවිකිරීමේ හා ස්ථාපන වියදම් පිළිවෙලින් රු. 200 000 හා රු. 300 000 වේ.

(ii) පැරණි යන්ත්‍රයේ පිරිවැය රු. 1 000 000 වන අතර, පැරණි යන්ත්‍රයේ විකුණුම් මිල රු. 400 000 කි.

(iii) පවතින කාරක ප්‍රාග්ධනය රු. 300 000 වන අතර, නව යන්ත්‍රයේ මිලදී ගැනීම් නිසා කාරක ප්‍රාග්ධනය රු. 200 000 කින් වැඩි වී ඇත.

(iv) නව යන්ත්‍රයේ සුන්බුන් අගය රු. 500 000 වන අතර, ඵලදායී ජීව කාලය වසර 04 කි.

(v) නව යන්ත්‍රයට අදාළ අනෙකුත් තොරතුරු පහත වේ.

වර්ෂය / විස්තරය	1	2	3	4
බදු පෙර ලාභය වැඩි වීම.	400	500	600	800
10% වට්ටම් සාධකය	0.9	0.8	0.7	0.6

වාර්ෂික ආදායම් බදු ප්‍රතිශතය බදු පෙර ලාභයෙන් 20% .

අවශ්‍ය වන්නේ,

(1) වසර 0 සිට 4 දක්වා මුදල් ගලා ඒම හා මුදල් ගලා යාම.

(2) ශුද්ධ වර්තමාන අගය.

(3) ශුද්ධ වර්තමාන අගයට අනුව යන්ත්‍රයේ මිලදී ගැනීමේ නිර්දේශය.

(5) පිළිගෙවුම් කාලය.

(6) ආයෝජන ප්‍රතිලාභ අනුපාතය. **(ලකුණු 15 යි.)**

(ඉ) **නැණතුවණ පාදන** සංගමයේ 2023.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ තොරතුරු පහත දැක්වේ.

රු.'000

	2023.03.31	2022.03.31
දේපළ, පිරියත හා උපකරණ	5 000	4 900
හිඟ හිටි සාමාජික මුදල්	300	200
කලින් ලද සාමාජික මුදල්	150	100
යාවජීව සාමාජික මුදල්	350	300
මුදල්	?	460

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී පහත ගනුදෙනු සිදු විය.

(i) 2022/2023 වර්ෂය තුළ ලද සාමාජික මුදල් රු. 1 000 000 වන අතර, මෙයින් රු.100 000 යාවජීව සාමාජික මුදල් වේ.

(ii) වාර්ෂික දේපළ පිරියත හා උපකරණ ක්ෂය වීම් රු. 300 000 වේ.

(iii) වර්ෂයට අදාළ ලිපිද්‍රව්‍ය වියදම රු. 80 000 වන අතර, 2023.03.31 දිනට ඉතිරි ලිපි ද්‍රව්‍ය රු. 20 000 වේ.

(iv) වර්ෂය තුළ ලද මුදල් පරිත්‍යාග රු. 500 000 වන අතර, පරිත්‍යාග වසර 05 තුළ ආදායම් ලෙස හඳුනා ගැනීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ.

(v) මෙහෙයුම් වියදම් සඳහා ගෙවීම රු. 150 000 වන අතර, විදුලි වියදම් රු. 40 000 ගෙවීමට ඇත.

අවශ්‍ය වන්නේ,

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා,

(1) මුදල් ගිණුම.

(2) සාමාජික මුදල් ගිණුම.

(3) ආදායම් ප්‍රකාශය.

(ලකුණු 10 යි.)

(මුළු ලකුණු 40 යි.)